මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක :PRE/2024/47** **2024.08.24**

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

## 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ විධිවිධාන

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ විධිවිධාන ප්‍රකාරව ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිණිස පවත්වනු ලබන 2024 ජනාධිපතිවරණ ඡන්ද විමසීම සඳහා තරග කරනු ලබන සියලුම පිළිගත් දේශපාලන පක්ෂ අපේක්ෂකයන්, වෙනත් දේශපාලන පක්ෂවල අපේක්ෂකයන්, ඡන්දහිමියකු විසින් නාමයෝජනා කළ අපේක්ෂකයන් සඳහා 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 03 වන වගන්තිය ප්‍රකාරව මෙකී ජනාධිපතිවරණ ඡන්ද විමසීම සඳහා තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ අපේක්ෂකයන්, වෙනත් දේශපාලන පක්ෂ අපේක්ෂකයන්, ඡන්දහිමියකු විසින් නාමයෝජනා කළ අපේක්ෂකයන් සමඟ සාකච්ඡා කර, විමසීමෙන් අනතුරුව එකී ඡන්ද විමසීමේ දී, තරග කරන අපේක්ෂකයන්ගේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් කළ හැකි වියදම් සීමාව එක් ඡන්ද හිමියකු සඳහා රු.109.00 ක් ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කොට ඇත.

| අනු අංකය | විස්තරය | වියදම් සීමාව (රු.) |
|---|---|---|
| 01. | 2024 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සඳහා තරග කරන අපේක්ෂකයාට වෙන් කළ මුදල (60%) | 1, 120, 979, 151.60 |
| 02. | 2024 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සඳහා අපේක්ෂකයෙකු ඉදිරිපත් කරන ලද පිළිගත් දේශපාලන පක්ෂය හෝ වෙනත් දේශපාලන පක්ෂය හෝ ඡන්දහිමියාට වැය කළ හැකි මුදල (40%) | 747, 319, 434.40 |
| | **එකතුව** | **1, 868, 298, 586.00** |

02. මැතිවරණ ප්‍රචාරක වියදම් ඇතුළත් වියදම් වාර්තාව මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර දින විසි එකක් (21) ඇතුළත අපේක්ෂකයාගේ අත්සන, දිවුරුම් කොමසාරිස්වරයා හෝ සාමදාන විනිශ්චයකාරවරයා විසින් සහතික කොට මැතිවරණ කොමිෂන් සභාව වෙත භාර දෙනු ලැබිය යුතු ය.

03 අපේක්ෂකයා වෙනුවෙන් පිළිගනු ලැබූ හෝ භාරගනු ලැබූ පරිත්‍යාග හෝ දායකත්ව සහ එම පරිත්‍යාග හෝ දායකත්ව ද්‍රව්‍යමය වශයෙන් ලැබුණේ නම් ඒවායේ ඇස්තමේන්තු වටිනාකම, එකී දායකත්ව පරිත්‍යාග කරනු ලැබුවේ ත්‍යාග, ණය මුදල්, අත්තිකාරම් හෝ තැන්පතු වශයෙන් ද යන වග සඳහන් කළ යුතු ය.

04. මේ පිළිබඳව සියළු තොරතුරු ඇතුලත් කොට මැතිවරණ කොමිෂන් සභාව විසින් අංක 2397/66 හා 2024 08.16 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කොට ඇති බැව් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්